00070

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3231 - සෞන්දර්යය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.26** **වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30**

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑ ම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.**

**I වන කොටස**

01. ‘සෞන්දර්යය’ යනු කවරේදැයි නිර්වචනය කරන්න.

02. සෞන්දර්යය අධ්‍යාපනයේ පොදු පරමාර්ථය කුමක් ද?

03. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

04. නාට්‍ය හා රංගකලා විෂයයේ පොදු පරමාර්ථය හා විෂය අරමුණු දෙකක් දක්වන්න.

05. ළමා ක්‍රියාකාරකම් සඳහා සංගීතය හා රිද්මය යොදා ගැනීමේ වාසි දෙකක් (02) දක්වන්න.

06. ඉගැන්වීම සඳහා ක්‍රීඩා ක්‍රමය යොදා ගැනීමේ වාසි දෙකක් (02) දක්වන්න.

07. සෞන්දර්යය විෂයයන් ඉගැන්වීමේ දී ගුරුවරයකු විසින් සැලකිලිමත් වියයුතු කරුණු පහක් (05) දක්වන්න.

08. දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කිරීම සඳහා භාවිත කළ හැකි ඔබ පරිසරයෙන් සොයාගත හැකි ඉවතලන ද්‍රව්‍ය පහක් (05) නම් කර, එය යොදා ගන්නා ආකාරය ද කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)



12

## II වන කොටස

09. i. සංගීත හා රිද්මයානුකූල චලන තුළින් දරුවාට ඉගෙන ගත හැකි වෙනත් විෂයයක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඔබ තෝරාගත් එම විෂයයෙහි ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ඔබ තෝරාගත් විෂයයට අදාළව ඉගෙනුම් අත්දැකීම් ලබාදීම සඳහා දරුවා සමඟ ඔබ ක්‍රියාකාරකම් සංවිධානය කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

10. i. අට වන (8) ශ්‍රේණියේ දරුවන්ට ඉගැන්වීම සඳහා සුදුසු ඔබ කැමැති පාඩමක් තෝරා ගන්න.

(ලකුණු 03)

ii. එම පාඩමට අදාළව ඔබට ක්‍රියාත්මක කළ හැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පහක් (5) පැහැදිලි කරන්න. (ලකුණු 17)

11. නාට්‍ය ගුරුවරයකු වශයෙන් සකස් වීමෙහි ලා ඔබගේ භූමිකාව කෙසේ සංවර්ධනය කරගත යුතුදැයි විස්තර කරන්න. අවශ්‍ය තැන් හි නිදසුන් දක්වන්න. (ලකුණු 20)

12. අවිධිමත් අධ්‍යාපන කාරකයක් වශයෙන් නාට්‍ය අධ්‍යාපනයෙන් සිදුවන සමාජ මෙහෙවර විමසන්න. (ලකුණු 20)

13. දරුවකුගේ වැඩීම හා සංවර්ධනය සඳහා සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වැදගත් වන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.